රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/2006(V)

මගේ අංකය : ආ5/1/26 (LXVI)
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2008.06.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2006 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ**
**වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම/උපරිමයේ රැඳීසිටීම**

සිය වැටුප් පරිමාණයෙහි උපරිමයට පැමිණි නිලධාරීන්ට වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධයෙන් 2007.01.25 දතමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(III) න් සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි ඇමුණුම II හි 4:4:2 ඡේදය 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන සේ පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

" 4:4:2 මෙහිලා වැටුප් පරිමාණයක උපරිමය යන්නෙන් අදහස් කෙරෙන්නේ යම් වැටුප් පරිමාණයක උසස්වීම් ක්‍රම ඇතුළත් වේ නම් එම සියලු උසස්වීම් ශ්‍රේණි අතර ඉහළම ශ්‍රේණියට අදාල වන වැටුප් පරිමාණයේ උපරිම පියවර හෝ උසස්වීම් ශ්‍රේණි/තනතුරු ඇතුළත් නොමැති නම් එම වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවරයි. කෙසේ වෙතත්, 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 මගින් අලුතින් හඳුන්වා දී ඇති පීඑල්-1, පීඑල්-2 සහ පීඑල්-3 යන වැටුප් කේත අංක යටතේ වන විශේෂ ශ්‍රේණිය ක්‍රියාත්මක වනතුරු එම වැටුප් පරිමාණයන්හි 1 වන ශ්‍රේණියට අයත් උපරිම පියවර වන අදාල පරිමාණයේ 31 වන පියවරට එළඹෙන නිලධාරීන්ට එම 31 වන පියවර ලැබීමට අදාල වූ වැටුප් වර්ධක අගය මත තවදුරටත් වැටුප් වර්ධක හිමි වේ. විශේෂ ශ්‍රේණිය ක්‍රියාත්මක වී සුදුසුකම් ලද තැනැත්තන් විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය/උසස් කිරීමෙන් පසු උපරිමය වශයෙන් සැලකිය යුත්තේ එම වැටුප් පරිමාණයන්හි 43 වන පියවරයි. "

02. **සංයුක්ත දීමනා**

2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) වැටුප් ගැලපීම මත සංයුක්ත දීමනාවෙහි අඩුවීමක් සිදුවී ඇත්නම්, අදල නිලධාරීන්ට පෞද්ගලික වන සේ එතෙක් හිමිකම තිබූ සංයුක්ත දීමනාව එපරිදිම ලබාදිය යුතුය.

03. **වාර්ෂික වැටුප් වැඩිවීම්**

3.1 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) යටතේ සිදුකරන ලද වැටුප් පරිවර්තනය මත ලැබෙන වැටුප් පියවර අනුව, වැටුප් වර්ධක අගය අඩුවී ඇත්නම්, (කලින් ලද වැටුප් වර්ධක අගයට වඩා අඩු වැටුප් වර්ධක අගයක් නියම කොට ඇති පියවරකට පැමිණ ඇත්නම්) ඔවුන් ඊට පෙර ලැබූ වැටුප් වර්ධක අගය සහ නව වැටුප් වර්ධක අගය අතර වෙනස, ගැලපීමේ දීමනාවක් වශයෙන්, එම නිලධාරියාට පෞද්ගලික වනසේ ගෙවිය යුතුය. මෙම ගැලපීමේ දීමනාව කලින් ලද වැටුප් වර්ධක අගයට සමාන හෝ වැඩිවන අවස්ථාව දක්වා, 2007.06.01 දිනට පසුව අදල වන වැටුප් වර්ධක සඳහා හිමිවේ.

උදාහරණ :

2007.05.31 දින වන විට, එම්එන්-2-2006 වැටුප් පරිමාණයේ I වන ශ්‍රේණියට අදාලව, රු. 17640/- වැටුප් පියවර ලැබූ නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(IV) අනුව 2007.06.01 සිට එම්එන්-2-2006-ඒ වැටුප් පරිමාණයේ රු. 17790/- වැටුප් පියවරේ පිහිටුවිය යුතුය. ඉන් අනතුරුව රු. 18750/- වැටුප් පියවර දක්වා රු. 240/- බැගින් වූ වැටුප් වර්ධක හිමිවේ. නමුත් ඒ වන විට නිලධාරියාට රු. 290/- බැගින් වූ වැටුප් වර්ධකවලට හිමිකම් තිබූ බැවින් රු. 50/- ක්වූ එම වෙනස, එක් වැටුප් වර්ධකයකට එක් ගුණයක් බැගින් වනසේ ගැලපීමේ දීමනා 04 ක් ලබා දිය යුතුය. රු. 18750/- වැටුප් පියවර සිට ඉදිරියට රු. 320/- බැගින් වැටුප් වර්ධක හිමිවන බැවින්, එතැන් සිට ඊට අතිරේකව ගැලපීමේ දීමනාව හිමි නොවේ. නමුත් විෂමතාව ඉවත්වන අවස්ථාවේ සැලසුනු ගැලපීමේ දීමනාවේ මුළු මූල්‍යමය අගය (රු. 50x4=200/-) නිලධාරියා වෙනත් ශ්‍රේණියකට/තනතුරකට පත්වන තුරු/උසස්වන තුරු දිගටම ගෙවිය යුතු අතර, වැටුපේ කොටසක් වශයෙන් වැටුප් වැඩිවීමේ සහතිකවල වෙනමම සඳහන් කළ යුතුය.

**ඉහත පරිදි ගැලපීමේ දීමනාව ගෙවිය යුතු ආකාරය**

| වැටුප් පියවර | | වැටුප් වර්ධක අගය | | වෙනස | |
|---|---|---|---|---|---|
| රු. 17790 | + | රු. 240/- | + | රු. 50 x 1 | |
| රු. 18030 | + | රු. 240/- | + | රු. 50 x 2 | |
| රු. 18270 | + | රු. 240/- | + | රු. 50 x 3 | |
| රු. 18510 | + | රු. 240/- | + | රු. 50 x 4 | |
| රු. 18750 | + | රු. 320/- | + | රු. 200/- | (ගැලපීමේ දීමනාවේ |
| රු. 19070 | + | ............ | + | රු. 200/- | මුළු මූල්‍යමය අගය) |
| රු. 19390 | | | + | රු. 200/- | ආදී වශයෙන් |

3.2 මෙම ගැලපීමේ දීමනාව සියළු කාර්යයන් සඳහා වැටුපේ කොටසක් ලෙස සැලකිය යුතු අතර, ගැලපීමේ දීමනාව ලබන කාලය තුළ නිලධාරියා උසස්වීමක් ලබයි නම් එම දීමනාවද යොදගෙන ඉන් අනතුරුව නව වැටුපට වැටුප් පරිවර්තනය කළ යුතුය. මෙම ගැලපීමේ දීමනාව හිමිවන්නේ, අඩු වැටුප් වර්ධක අගයක් සහිත පියවරකට පැමිණීමෙන් පසුව එම අඩු වැටුප් වර්ධක අගය මත උපයාගන්නා වැටුප් වර්ධක වෙනුවෙන් පමණක් බව විශේෂයෙන් සටහන් කරගත යුතුය.

04. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය